# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

තැ. පෙ. / த. பெ. / P.O. Box } 572 | දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary } දුර./தொ./Tel : 011 2381154; ෆැක්ස් /தொ./Fax : 011 2541529; වි. තැපෑල/மி.அ./Email : secdefence@defence.lk

මගේ අංකය / எனது இல / My No } MOD/DEF/GS/4/SALW/2/SLA/60122

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2023.07. 10


යුද්ධ හමුදාපති,
යුද්ධ හමුදා මූලස්ථානය.

නාවික හමුදාපති,
නාවික හමුදා මූලස්ථානය.

ගුවන් හමුදාපති,
ගුවන් හමුදා මූලස්ථානය.

**<u>ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ අවිවාහක හා තනිව නඩත්තු විය නොහැකි ස්ථිර ආබාධිත සහෝදරයන් වෙත වැටුප් හා දීමනා හිමිගැන්වීම.</u>**

යොමුව - (අ). අමප අංක/1982/305/09 හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය.
(ආ). D/COMP/D/AY/239 හා 1995.01.30 දිනැති මෙම අමාත්‍යාංශ ලිපිය.
(ඇ). E/323/2020 හා 2020 නීතිපති උපදෙස් ලිපිය.
(ඈ). Add.sec(MS)04/IUM/2022 හා 2023.06.30 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ලිපිය.

02. යොමුගත (අ) හා (ආ) දරණ ලිපි අනුව ක්‍රියාන්විත ප්‍රදේශවලදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියයන රණවිරුවන් වෙනුවෙන් යැපෙන්නන්ට හිමි වැටුප් හා දීමනා ලබාදීමේදී, මියගිය හමුදා සාමාජිකයාගේ පහත සඳහන් පරිදි කිට්ටු ඥාතීවරයාට වැටුප් හා දීමනා හිමිගැන්වීමට විධිවිධාන ලබා දී ඇත.

i. බිරිඳ හා දරුවන්
ii. මව හා පියා
iii. මියගිය නිලධාරියා අවිවාහකයෙක් නම් දෙමව්පියන් මියගොස් ඇත්නම් අවිවාහක අවුරුදු 18ට අඩු ඔහුගේ සහෝදරයින් සහ රැකියා විරහිත අවිවාහක සහෝදරියන්

03. එමෙන්ම යොමුගත (ඇ) දරණ ලිපිය ප්‍රකාරව මියගිය හමුදා සාමාජිකයෙකුගේ දෙමාපියන් ද මියයාමෙන් පසුව තනිව නඩත්තු විය නොහැකි හා වෛද්‍ය මණ්ඩලයක් මගින් ස්ථිර ආබාධිත යැයි තහවුරු කරනු ලබන අවිවාහක සහෝදරයන් වෙත හිමිකම් ලබාගැනීමට, යුද්ධ හමුදාව වෙතින් මෙම අමාත්‍යාංශය වෙත ලද ඉල්ලීමක් අනුව එලෙස ගෙවීමේ හැකියාව පිළිබඳව ගරු නීතිපතිතුමා වෙතින් උපදෙස් විමසන ලදී. එහිදී මියයන හමුදා සාමාජිකයන්ගේ "අවිවාහක, තනිව නඩත්තු විය නොහැකි හා වෛද්‍ය මණ්ඩලයක් මගින් ස්ථිර ආබාධිත" යැයි තහවුරු කරන ලද පුද්ගලයන් හට මියගිය නිලධාරියා වෙනුවෙන් හිමිගන්වන වැටුප් හා දීමනා ගෙවීම සම්බන්ධයෙන් නෛතික බාධාවක් නොමැති බව නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් දන්වා ඇත.

04. ඒ අනුව විෂයගත කරුණ සම්බන්ධව ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධව වැටුප් හා දීමනා හිමිගැන්වීමේ හැකියාව සලකා බැලීම සඳහා අදාළ ආබාධිත පුද්ගලයන්ගේ ආබාධිත තත්ත්වය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් පත්කරනු ලබන වෛද්‍ය මණ්ඩලයක් මගින් තහවුරු කරගත යුතුව ඇත.